# "මහජන පුස්තකාල සේවා ප්‍රවර්ධනයෙහිලා කළමනාකරණ භූමිකා ප්‍රවේශය යොදාගැනීම සහ ඒ ආශ්‍රිත නිපුනතා පිළිබඳ අධ්‍යයනයක්"

මහාචාර්ය එච්. ඒ. වීරසූරිය

පුස්තකාල හා විඥාපන අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකා

**සාර සංග්‍රහය (Abstract)**

සංවිධානයක / ආයතනයක සපයන සේවා ප්‍රවර්ධනයෙහිලා විවිධ ප්‍රවේශයන් (Approaches) භාවිතා කරනු ලැබේ. මෙහිලා කළමනාකරණ මූලධර්ම, විවිධ ආගම්, සංස්කෘතිකාංග හෝ දර්ශන, න්‍යාය, මතවාද, ආකෘති, මාදිලි, ප්‍රවේශයන්, ප්‍රතිපත්ති, තීරණ, විශ්ලේෂණ, ශිල්පයන්, කතිකාවන්, පරමාදර්ශයන්, අඩු වැඩි වශයෙන් භාවිත කළ හැකිය. මෙම ලිපියේ මූලික පරමාර්ථය වන්නේ මහජන පුස්තකාලයකින් සපයන සේවා ප්‍රවර්ධන සඳහා කළමනාකරණ භූමිකා ප්‍රවේශය යොදාගත හැක්කේ කෙසේද යන්න අධ්‍යයනය කිරීමයි. ලිපියේ සෙසු අරමුණු අතර මහජන පුස්තකාල පොදු අරමුණු සහ වෙනත් භූමිකා විග්‍රහ කිරීම, මහජන පුස්තකාලයක දායක පාර්ශව ගවේෂණය කිරීම, කළමනාකරණයේ දක්වෙන කුමන කාර්යයන් ප්‍රවේශයන් ලෙස මහජන පුස්තකාල සේවා ප්‍රවර්ධනය සඳහා යොදාගත හැකිද විමර්ශනය, යොදාගැනීමේ අවශ්‍යතාව, වැදගත්කම අධ්‍යයනය කිරීම.මෙම භූමිකාවල ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලයාධිපතින් සඳහා කුමන අන්දමේ නිපුනතා ගැලපී පැවතිය යුතුද යන්න අධ්‍යයනය කිරීම සඳහා සුදුසු ආකෘතියක් සම්පාදනය කිරීමයි.

**Abstract**

Generally, every organization applies various approaches in order to improve the quality of its different services. In this context, principles of management, different religions and their thoughts, cultural elements or philosophies, theories, concepts, models, approaches, policies, decisions, analytical techniques, discourses and paradigms areby and large used interchangeably by the organizations. Principal purpose of this article is to study how the management role approach could be used for the improvement of the services provided by the public libraries. The other objectives are to explore what are the common objectives of public libraries including the other roles, to investigate the profile of stakeholders of public libraries, to examine the other managerial roles and functions which affect library service improvement and to study the competencies which will fit for the public librarians in Sri Lanka.

Keywords: - Pubic Libraries, Management Information Service, Libraries, Competencies, Leadersh, Library Management

*corresponding author – Email: sunimal22@gmail.com